// I වැනි කොටස

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1945/21 - 2015 දෙසැම්බර් මස 16 වැනි බදාදා - 2015.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ මහනුවර මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන මහනුවර මහ නගර සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

සින්නයියා සිවඥනම් නම් වූ තනතුර දරූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාලපරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ මහනුවර මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන තුඹානේ ත්‍රිභුවන කීර්තිසිංහ දුණුවීර මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මහනුවර මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, තුඹානේ ත්‍රිභුවන කීර්තිසිංහ දුණුවීර මහතා මහනුවර මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම් භාර නිලධාරී,
මහනුවර මහ නගර සභාව.

2015 දෙසැම්බර් මස 15 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

01 - 106

1A - G 22717— 21 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.